# සිංහල සාහිත්‍යාගත 'බුද්ධ, බෝධි සහ බෝසත් සංකල්ප' මහායාන සංකල්ප නොවේ

නාවලපිටියේ අනුරාධා සුධම්මිකා භික්ෂුණිය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
anurammika@gmail.com

මෙම පර්යේෂණ පත්‍රිකාවෙන් අපේක්ෂා කළේ 'බුද්ධ, බෝධි සහ බෝසත් ' යන සංකල්ප' ඇති වුයේ කෙසේ ද? ව්‍යාප්තවූයේ කෙසේද? එම සංකල්ප මහායාන හෝ ථේරවාදීද? යන ප්‍රශ්නවලට විසඳුම් ලබා දීම ය. පර්යේෂණ ගැටලුව වූයේ, ''බුද්ධ, බෝධි සහ බෝසත් සංකල්ප' මහායාන සංකල්පයන්ද?'' යන්න විමසීමයි. 'බුධ-බෝධ-බෝධනෙ-බෝධති' යන සංස්කෘත ක්‍රියාපද විග්‍රහයෙන් කියැවෙන 'බුද්ධ' යන්නෙන් 'අවබෝධය' ලැබීම නම් වූ අර්ථය ගම්‍යමාන වේ. 'චතුරාර්ය සත්‍ය ධර්මය අවබෝධය 'බුද්ධ'හෙවත් 'බෝධි' යනුවෙන් අවධාරණය කෙරේ. 'බෝසත්' යන්නෙන් සසරින් මිදීම සඳහා උත්සාහවත් වන ඕනෑම කෙනකු හැඳින්වීමට හැකිය' යන ප්‍රකාශය මහායාන යැයි ථේරවාද සම්ප්‍රදායට අනුව විශ්වාස කළ ද එය ථේරවාද හෝ මහායාන සංකල්පයක් නොව බුද්ධ දේශනාවක් බව සංයුත්තනිකායේ බෝධිසූත්‍රයෙන් මතුකර ගන්නා ලදි. පර්යේෂණයෙහි ප්‍රධාන අරමුණ වූයේ ගැටුම් අවම කර ගැනීමෙහිලා බෝසත් සංකල්පය යොදා ගැනීමයි. 'බුද්ධ, බෝධි සහ බෝසත් සංකල්ප' බුද්ධ දේශනාවක් වූ නිසා එය ජීවිතවලට ආදේශ කරගත හැකි ආකාරය මතු කර දක්වීමේ අවශේෂ අරමුණු වූයේ, තමන් බෝසත් හෙවත් බුද්ධිමත් කෙනෙකු ලෙස සිතීමෙන් ක්‍රියා කිරීමෙන් බුද්ධිමතෙකුගේ ලක්ෂණ ජීවිතවලට ආදේශ කර ගැනීමට හැකි බව පෙන්වා දීමෙන්, තමා හා අවට පරිසරයට, එනම් ගහකොළ සත්ව වර්ගයා වෙනුවෙන් සංවේදී වීමට හැකි ගුණාංගයන්ගෙන් යුතු සත්පුරුෂ  ශ්‍රාවක පාඨක පිරිසක් ඇති කිරීමයි. එම ආධ්‍යාත්මික සංවර්ධනයෙන් යුත් මිනිසුන් බවට ශ්‍රාවකයන් පරිවර්තතනය වීමෙන් සමාජයේ ගැටුම් අවම කර ගැනීමත් සමාජයට හිතකර සාමකාමී පිරිසක් ඇති කර ගැනීමත් ආත්මාර්ථය අභිබවා පරාර්ථය මෙන් ම උභයාර්ථ සංසිද්ධිය ගැන ද විමසිලිමත් වන පුද්ගලයින් වන්නේ කෙසේද? යන්න පැහැදිලි කර දීමත් මෙම පර්යෙෂණ පත්‍රිකාවෙන් අපේක්ෂිතය. මෙ පර්යේෂණයේ ක්‍රමවේදය වූයේ ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය භාවිතයයි. මේ සඳහා 'ප්‍රාථමික මූලාශ්‍රය ලෙස තෝරාගත් 'ධර්මප්‍රදීපිකාව, අමාවතුර සහ පූජාවලිය' 'විශුද්ධි මාර්ග මහා සන්නයේ පඤ්ඤාභූමි නිද්දේසයත් ඇසුරින් ද්විතීයික මූලාශ්‍රය ලෙස මොරටුවේ සාසනරතන හිමියන්ගේ 'ලක්දිව මහායාන අදහස්' කෘතියත් පිටක ග්‍රන්ථ සහ අවශේෂ ග්‍රන්ථත් සමග සසඳා  බලා තොරතුරු ඒකරාශිකොට, ඒවා වර්ගීකරණය කිරීමෙන්  නිගමනයකට එළැඹිණි. 'වෙනත් අරමුණු යටතේ 'මහායාන සංකල්පයකැයි ථේරවාදීන් විසින් පහළට හෙළන ලද 'බුද්ධ සංකල්පය' සහ 'බෝසත් සංකල්පය' ගැන ඇති චින්තනයට වඩා 'සිංහල ගත්කතුවරුන් 'බෝසත් සංකල්පය' හඳුන්වා දී ඇති ආකාරය ඉස්මතු කිරීමත්, එම ගතිගුණ වර්තමාන මිනිස් සිත්වලට පුහුණු කිරීමට උපදෙස් සැපයීමෙන් සත්පුරුෂ බෝසත් ජනසමාජයක් බිහි කිරීමට ශ්‍රාවක පාඨක ජනතාව උත්සාහ කරවීමත් මෙයින් අපේක්ෂිතය.

**ප්‍රමුඛ පදඃ** බුද්ධ; බෝසත්; බෝධි; ථේරවාද; මහායාන